# ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමය අන්තර්ජාතික මට්ටමින් නිරූපණය කිරීමෙහිලා ඇසළ පෙරහරේ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එන්.කේ.ඩී.එච්. ශෂිකලා[1]

ප්‍රමුඛ පදඃ අන්තර්ජාතික, ඇසළ පෙරහර, උරුමය, සංස්කෘතික, ශ්‍රී ලංකාව

## හැඳින්වීම

ශ්‍රී ලංකාව තම පොහොසත් ඓතිහාසික හා සංස්කෘතික උරුමය හේතුවෙන් ලොව පුරා ප්‍රසිද්ධියට පත් වූ රාජ්‍යයකි. මෙම උරුමයේ කේන්ද්‍රීය අංගයක් ලෙස වාර්ෂිකව මහනුවර පැවැත්වෙන ඇසළ පෙරහර සැලකිය හැකිය. ඇසළ මාසයෙහි ජූලි- අගෝස්තු ලක්දිව ප්‍රධාන විහාරස්ථාන කිහිපයක් මුල් කොටගෙන පැවැත්වෙන අලංකාර පෙරහැර දේශීය ජනයාගේ මෙන්ම විදේශිකයන්ගේ ආකර්ෂණයට ලක් වූ දේශීය සංස්කෘතිකාංගයකි. මහනුවර මෙන්ම අලුත්නුවර, නවගමුව, දෙවුන්දර, රත්නපුර, කතරගම ආදි ස්ථානවල ඇසළ පෙරහර පැවැත්වුණ ද ඉතා උත්කර්ෂවත් අන්දමින් ඇසළ පෙරහර පවත්වන්නේ මහනුවර දළදා මාළිගාව ආශ්‍රිතවය. දෙස් විදෙස් බෞද්ධ දනන්ගේ මෙන්ම ශ්‍රී ලාංකීය රාජ්‍යත්ව සංකේතයක් බඳු වූ ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ එදා මෙදා තුර පූජෝපහාර ලබමින් වසරක් පාසා අති උත්කර්ෂවත් අන්දමින් වීදි සංචාරය කරනු ලබන්නේය. මෙය හුදෙක් ආගමික පෙරහැරක් පමණක් නොව දේශීය කලාව, ජන සම්ප්‍රදාය ,බෞද්ධ දර්ශනය හා ජාතික අනන්‍යතාවය විදහා දක්වන අද්විතීය සංස්කෘතික ප්‍රකාශනයකි. ශ්‍රී දළදා මාළිගාවේ දළදා වහන්සේ උදෙසා පවත්වන ආගමික කලාත්මක හා සමාජ ගෞරවය පුළුල් ලෙස නිරූපණය කරන උත්සවයක් ලෙස දැක්විය හැකිය.

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයක් (Qualitative research approach) භාවිත කර ඇත. එහිදී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර උපයෝගී කරගෙන ඇත. ද්විතීයික දත්ත රැස් කිරීම සඳහා ඇසළ පෙරහැර ශ්‍රී ලාංකීය සංස්කෘතිය, සංචාරක ව්‍යාපාරය සහ උරුම කළමනාකරණය පිළිබඳව රචනා කර ඇති ශාස්ත්‍රීය ලිපි, පර්යේෂණ වාර්තා, විශ්වවිද්‍යාල නිබන්ධන, පොත්පත්, පුවත්පත් ලිපි සහ රජයේ සංචාරක ප්‍රවර්ධන ද්‍රව්‍ය පුළුල් ලෙස විශ්ලේෂණය කරන ලදී. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා අර්ධ-ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා (Semi - structured interviews ) ක්‍රමය භාවිත කරන ලදී. මෙහිදී සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී වූ පුද්ගලයන් අතර, ඇසළ පෙරහැර සංවිධායක කමිටු සාමාජිකයන්, ශ්‍රී

[1] පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
nanayakkarahashani4@gmail.com

දළදා මාළිගාවේ නිධාරීන්, ප්‍රධාන පෙරහැර සංස්කෘතික නර්තන ශිල්පීන්, සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සහ විදේශීය සංචාරකයන් කිහිප දෙනෙක් ද ඇතුළත් විය.

මෙම සම්මුඛ සාකච්ඡා මඟින් පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම්, අදහස්, දැක්ම සහ එය අන්තර්ජාතිකව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ අදහස් ලබා ගැනීමට හැකි විය. සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගත් දත්ත, තේමාත්මක විශ්ලේෂණය (Thematic analysis) ඔස්සේ විග්‍රහ කරන ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡා**

මෙම පර්යේෂණ ප්‍රතිඵල අනුව, ඇසළ පෙරහර ශ්‍රී ලාංකීය සංස්කෘතික උරුමය අන්තර්ජාතික මට්ටමින් නිරූපණය කිරීමෙහිලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන බව පැහැදිලිය.

අද්විතීය දෘශ්‍යමාන සංස්කෘතික අංග-: පෙරහැරේ ඇති අලංකාරවත් ඇඳුම් පැළඳුම්, සාම්ප්‍රදායික නර්තන අංග (උඩරට, පහතරට, සබරගමු), බෙර වාදන, ගිනි කෙළි සහ අලංකාර ලෙස සරසන ලද අලි ඇතුන් පෙරහැරට අද්විතීය දෘශ්‍යමාන අලංකාරයක් එක් කරයි. මෙම දර්ශනීය අංග විදේශීය ප්‍රේක්ෂකයන්ට ශ්‍රී ලංකාවේ කලාව, සංගීතය සහ නර්තනය පිළිබඳ සුවිශේෂී අත්දැකීමක් ලබා දෙයි. විශේෂයෙන්ම, ශ්‍රී දළදා කරඬුව වැඩමවන දළදා හස්තියා පෙරහරේ කේන්ද්‍රීය ආකර්ෂණය වන අතර, එය ශ්‍රී ලංකාවේ බෞද්ධ උරුමයේ සංකේතයක් ලෙස ලොවට විදහා දක්වයි.

ආගමික හා සංස්කෘතික නැඹුරුතාවය - පෙරහර හුදෙක් විනෝදාස්වාදයක් පමණක් නොව, බෞද්ධ දර්ශනයේ සහ දේශීය විශ්වාසයන්ගේ ගැඹුරු මුල් බැසගත් මංගල්‍යයකි. විදේශීය සංචාරකයින්ට මෙය ශ්‍රී ලංකාවේ ජන ජීවිතය, ඇදහිලි සහ සම්ප්‍රදායන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාවක් සලසයි. පෙරහර පුරා විහිදී ඇති ආගමික භක්තිය සහ සාම්ප්‍රදායික චතාවත්, සංචාරකයින්ට ශ්‍රී ලාංකීය අනන්‍යතාවයේ සුවිශේෂී ගති ලක්ෂණ අත්විඳීමට උපකාරී වේ.

සංචාරක ව්‍යාපාරයට දායකත්වය සෑම වසරකම ඇසළ පෙරහර නැරඹීම සඳහා දහස් ගණනක් විදේශීය සංචාරකයින් ශ්‍රී ලංකාවට පැමිණෙති. මෙය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට විශාල ආර්ථික දායකත්වයක් සපයයි. හෝටල් කර්මාන්තය, ප්‍රවාහන සේවා, සිහිවටන කර්මාන්තය සහ දේශීය ව්‍යාපාර සඳහා පෙරහර මගින් විශාල ආදායමක් උපදවයි. තවද, ජාත්‍යන්තර මාධ්‍ය ආවරණය තුළින් ශ්‍රී ලංකාව පිළිබඳ ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩනැගීමට ද පෙරහර උපකාරී වේ.

අභියෝග - අන්තර්ජාතිකව පෙරහර ප්‍රවර්ධනය කිරීමේදී සහ එහි උරුමය ආරක්ෂා කර ගැනීමේදී අභියෝග කිහිපයක් ද පවතී. ගෝලීය තරඟකාරිත්වය

හමුවේ අන්තර්ජාතික ප්‍රවර්ධන උපාය මාර්ග තවදුරටත් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය, පෙරහරේ සත්‍යතාව සහ සාම්ප්‍රදායිකත්වය රැක ගැනීම (විශේෂයෙන්ම වාණිජකරණය හමුවේ), සහ තිරසාර සංචාරක ව්‍යාපාරය දිරිගැන්වීම සඳහා වන අභියෝග මෙයට ඇතුළත් වේ. උදාහරණයක් ලෙස, අලි ඇතුන්ගේ සුබ සාධනය පිළිබඳව ජාත්‍යන්තරව මතුවන ප්‍රශ්න, පෙරහරේ කීර්ති නාමයට බලපෑම් කළ හැකිය.

සමාලෝචනය

මෙම පර්යේෂණය තුළින් ඇසළ පෙරහර ශ්‍රී ලාංකීය සංස්කෘතික උරුමය අන්තර්ජාතික මට්ටමින් නිරූපණය කිරීමෙහිලා ඉටු කරන සැලකිය යුතු දායකත්වය තහවුරු කරයි. එය ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය, ආගමික සහ සංස්කෘතික වටිනාකම ලොවට ප්‍රදර්ශනය කරන ප්‍රබල මාධ්‍යයකි. පෙරහරේ දෘශ්‍යමාන අලංකාරය, ආගමික නැඹුරුතාවය සහ සංචාරක ආකර්ෂණය ශ්‍රී ලංකාවට ගෝලීය කීර්තියක් ගෙන එයි.

ප්‍රතිපත්ති සම්පාදකයින්, සංචාරක ප්‍රවර්ධන ආයතන සහ සංස්කෘතික සංවිධාන ඇසළ පෙරහරේ උරුමය ආරක්ෂා කර ගැනීමටත්, එය තිරසාර ලෙස ප්‍රවර්ධනය කිරීමටත්, ඒ තුළින් ශ්‍රී ලංකාවේ සංස්කෘතික අනන්‍යතාවය ගෝලීය වශයෙන් තවදුරටත් ශක්තිමත් කිරීමටත් ක්‍රියා කළ යුතුය. අලි ඇතුන්ගේ සුබසාධනය, පරිසර හිතකාමී භාවිතයන් සහ ප්‍රජා සහභාගීත්වය වැනි අංග කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පෙරහරේ අන්තර්ජාතික පිළිගැනීම තවදුරටත් වැඩිදියුණු කළ හැකි බව මෙමඟින් ගම්‍ය වේ.

ආශ්‍රිත මූලාශ්‍රය

කඹුරුගමුවේ, වජිර ස්ථවිර. (2008). ***දළදා ඉතිහාසය හා සංස්කෘතිය***. දෙහිවලඃ තිසර ප්‍රකාශකයෝ.

ජයකොඩි, සරත්චන්ද්‍ර.***සිරි දළදා පවත.*** කොළඹ 06ඃ සදිසා පොත්හල.

Sri dalada maligawa, (2024 August 19). Daladawaruna, https://online.fliphtml5.com/gdpht/zaqi/#p=1